**ශීර්ෂය - 307 මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

------------------------------------------------------------

# 1. මූල්‍ය ප්‍රකාශන

------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි **30** දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

----------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු

අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බව.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ **2021** දෙසැම්බර් **31** දිනට එකතුව හා එදිනට දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය අතර රු.**2,071,479**ක වෙනසක් පැවතුණි. | 2002 වර්ෂයේ දී රු.15,000කින් ආරම්භ වී 2005 වර්ෂය වන විට රු.1,500,000ක් දක්වා ශේෂය වැඩි වී ඇති බව පෙන්නුම් කෙරේ. තවදුරටත් සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කරමි. | ගනුදෙනු, අදාළ ලේඛන හා ප්‍රභව ලියවිලි සමඟ සසඳා ගිණුම්ගත කිරීම. |

**1.6.2 හඳුනා නොගත් ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළව ආදායම ලෙස හඳුනාගත යුතු රු.18,598,049ක මුදලක් විධිමත් පරිදි හඳුනාගෙන ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කිරීම වෙනුවට හඳුනා නොගත් ලැබීම් ලෙස බැංකු සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි. | හඳුනා නොගත් ලැබීම් රු.18,476,885ක් නිරවුල් කිරීමට කටයුතු කර ඇති අතර ඉතිරි රු.121,164ක මුදල ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරමි. | ගනුදෙනු නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කිරීම. |

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 110 පරිදි හානි හා පාඩු ලේඛනයක් යාවත්කාලීන කර නොතිබීම. | මේ වන විට යාවත්කාලීන කර පවත්වාගෙන යන බව දන්වමි. | මුදල් රෙගුලාසිවලට අනුකූලව සියලු ලේඛන, පොත්පත් ආදී දෑ පවත්වාගෙන යා යුතු වීම. |
| (ආ) මුදල් රෙගුලාසි 1645 පරිදි වාහන ලොග් පොත් යාවත්කාලීන කර නොතිබීම. | - එම - | - එම - |
| (ඇ) මුදල් රෙගුලාසි 341 පරිදි උප පත්‍රිකා පොත් ලේඛනයක් පවත්වා නොතිබීම. | - එම - | - එම - |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1** **ආදායම් කළමනාකරණය**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) මු.රෙ.128 (2) (ඈ) සහ අංක 01/2015 දරන 2015 ජුලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 07 ඡේදය පරිදි ආදායම් සංකේතාංක 04 වෙනුවෙන් 2020 වර්ෂයේ කාර්තුමය ආදායම් වාර්තා කිසිවක් විගණිත දින වන විටත් පිළියෙල කර නොතිබුණි. | ආදායම් සංකේතාංක 04 වෙනුවෙන් 2022 වර්ෂයේ සිට කාර්තුමය ආදායම් වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ඉලක්ක දිනවලදී අප්‍රමාදව වාර්තා ඉදිරිපත් කිරීම. |
| (ආ) මු.රෙ.128 (2) (ඈ), මු.රෙ.176 (1) සහ අංක 1/2015 හා 2015 ජුලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 08 ඡේදය පරිදි අංක 1003- 07-09 දරන ආදායම් සංකේතය යටතේ අර්ධ වාර්ෂික හිඟ ආදායම් වාර්තා එකී කාලසීමාව අවසන් වී මාසයක් ඇතුළත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂවරයාට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2021 වර්ෂයට අදාළව එම වාර්තා කිසිවක් පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | - එම - | -එම- |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන වැය විෂයයන් 05ක් සඳහා රු.මිලියන 960.70ක අධි ප්‍රතිපාදන සලසාගෙන තිබූ අතර ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.මිලියන 443.52ක් විය. එම ඉතිරිය සලසා තිබූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 45.94 සිට සියයට 100 දක්වා වූ පරාසයක් ගෙන තිබුණි. | අරපිරිමැස්මෙන් වියදම් දැරීම, වාහන ආනයනය සීමා කිරීම නිසා අංක තහඩු මිලදී ගැනීම අවම වීම නිසා, කොවිඩ් 19 හේතුවෙන් රියදුරු බලපත්‍ර නිකුත් කිරිම සීමා වීම ආදි හේතු නිසා මෙම ඉතිරි වීම් සිදු වී ඇත. | තාත්වික ලෙස ඇස්තමේන්තු සකස් කිරීම. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දී ප්‍රාග්ධන වැය විෂයයන් 07ක් සඳහා රු.මිලියන 1387.70ක අධි ප්‍රතිපාදන සලසාගෙන තිබූ අතර ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.මිලියන 676.45ක් විය. එම ඉතිරිය සලසා තිබූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 42.56 සිට සියයට 100 දක්වා වූ පරාසයක් ගෙන තිබුණි. | - එම - | -එම- |
| (ඇ) අංක 307-2-1-12-1102, 307-2-1-12-2102, 307-2-1-12-2104 හා 307-2-1-12-2106 දරන වැය විෂයයන් සඳහා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන එනම්, පිළිවෙලින් රු.3,200,000 රු.50,000,000, රු.50,000,000 හා රු.25,000,000ක් යන ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම (100%) ඉතිරි වී තිබුණි. | ඊ - මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ප්‍රතිපාදන වෙන් කළත්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බැවින් මහා භාණ්ඩාගාරය වෙත නැවත පවරා දෙන ලදි. | -එම- |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන වැය විෂයයන් 06ක් සඳහා මු.රෙ. 66/69 ප්‍රකාරව එක් වැය විෂයයක් මඟින් (03-1409) රු.මිලියන 21.6ක අමතර ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. | ප්‍රවාහන වියදම් ඉහළ යාම, නිලධාරීන්ගේ හිඟ වැටුප් ගෙවීම, ආරක්ෂිත සේවාවල ගාස්තු සංශෝධනය කිරීම ආදී කරුණු හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන්ගෙන් අමතර ප්‍රතිපාදන මාරු කර ගැනීමට සිදු වූ බව දන්වමි. | -එම- |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළැඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සටහන - (iii) ආකෘතිය අනුව වූ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයක් පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | විගණකාධිපති විසින් දක්වා ඇති නිරීක්ෂණ හා එකඟ වෙමි. මින් ඉදිරියට එම වරද නිවැරදි කර ගිණුම් පිළියෙල කරන බව දන්වා සිටිමි. | නීතිරීති හා රෙගුලාසි මඟින් දක්වා ඇති සියලු ආකෘති මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කළ යුතු වීම. |
| (ආ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී 2021 දෙසැම්බර් 31 දිනට බැරකම් ලෙස හඳුනානොගත් රු.52,393,343ක් 2022 වර්ෂයේ දී පියවා තිබුණි. | - එම - | සමාලෝචිත වර්ෂයට අදාළ සියලු වියදම් නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වීම |
| (ඇ) මුදල් රෙගුලාසි 94(I) ප්‍රකාරව ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට බැඳිය නොහැකි වුවද, දෙපාර්තමේන්තුව විසින් වැය විෂයයන් 05ක ඉතිරි වීම් ඉක්මවා රු.10,615,357ක බැරකම් සඳහා බැඳී තිබුණි. | ඉදිරියේ දී වෙන් කළ ප්‍රතිපාදන සීමාව ඇතුලත බැදීම් හා බැරකම් ඇති කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | ප්‍රතිපාදන සීමාව තුළ බැදීම් හා බැරකම් ඇති කර ගතයුතු වීම. |
| (ඈ) 2021 ඔක්තෝම්බර් 26 දිනැති හා අංක SA\MAA\02\01\01 දරණ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2021 හි 4.5 ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාරය වෙත වාර්තා නොකරන ලද කිසිඳු බැදීමක් හෝ බැරකමක් 2022 වර්ෂය තුළ නිරවුල් නොකලයුතු බව දක්වා ඇතත්, විගණනය වෙත ඉදිරිපත් කරන ලද බැරකම් පිළිබඳ ප්‍රකාශයේ (සටහන IV) හි දක්වා තිබූ අගයන් හා භාණ්ඩාගාර සමුච්චිත බැදීම් හා බැරකම් පිළිබඳ වාර්තාවෙහි (SA 92) සඳහන් අගයන් අතර රු.374,466,747ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේ දී ප්‍රමාද වී ලැබෙන බැරකම්, බැරකම් ලෙස නොගැනීමට කටයුතු කරන බව දන්වමි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මිය ගොස් වර්ෂ 05කට වඩා කල්ගත වී තිබුණු එකතුව රු.536,749ක ණය ශේෂ 15ක් නිරවුල් කර නොතිබුණි. | තොරතුරු සොයාගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් විමසීම, ඇපකරුවන්ගෙන් අය කර ගැනීමට තොරතුරු සොයා බැලීම සිදු කරමින් පවතී. | සියලු ණය ශේෂ අප්‍රමාදව නිරවුල් කිරීමට පියවර ගැනීම |
| (ආ) | මු.රෙ. 485 (4) හා මු.රෙ. 113 (6) (ආ) පරිදි ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ තුන් මසක් ඇතුළත නිරවුල් කළ යුතු වුවත්, ස්ථාන මාරු වී ගිය නමුත් 2021 දෙසැම්බර් 31 දින දක්වා නිරවුල් නොකළ ණය ශේෂය රු.649,315ක් වූ අතර, එයින් වර්ෂ 05කට වඩා වැඩි ණය ශේෂයන්ගේ එකතුව රු.465,885ක් විය. | තොරතුරු සොයාගැනීමට රාජ්‍ය සේවා, පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශයෙන් විමසන ලදි. | -එම- |
| (ඇ) | විශ්‍රාම වැටුප් අත්හිටවූ නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු වූ රු.302,722ක ණය ශේෂය වර්ෂ 05කට වඩා පැරණි වූ අතර වර්ෂ 2-3 අතර කාලයට අයත් රු. 176,565ක ණය ශේෂයක්ද විගණනයේදී නිරීක්ෂණය විය. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් තොරතුරු සොයා ණය අයකර ගැනීමටත් අවුරුදු 05ට වැඩි රු.25,000ට අඩු ණය ශේෂ කපාහැරීමට කමිටුවක් පත් කර ගැනීමට කටයුතු කර ඇත. | අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම |
| (ඈ) | වැඩ තහනම් කළ නිලධාරීන් 21 දෙනෙකුගෙන් අය විය යුතු රු.1,671,988ක ණය ශේෂ එම ණයකරුවන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට 2021 දෙසැම්බර් 31 දින වන විටත් අපොහොසත් වී තිබුණි. වර්ෂ 05 ඉක්ම වූ එකතුව රු. 1,170,753ක ණය ශේෂ 17ක්ද ඒ අතර විය. | ඇපකරුවන්ගෙන් අයකර ගැනීමටත් තොරතුරු සොයාගැනීම රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් විමසීමත්, අවුරුදු 05ට වැඩි රු.25,000ට අඩු ණය ශේෂ කපාහැරීමට කමිටුවක් පත් කිරීමටත් කටයුතු කර ඇත. | කල් ඉකුත් වී ඇති බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම |
| (ඉ) | අවසාන වාරිකය අය කර වර්ෂ 05කට වඩා කල්ගත වී තිබුණු සේවය අත්හැර ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් අය විය යුතු | - එම - | -එම- |

| | | |
|---|---|---|
| රු.185,388ක ණය ශේෂයක් ද, වර්ෂ 2-3ත් අතර කාලයට අයත් රු.48,654ක ණය ශේෂයක්ද, අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | | |
| (ඊ) විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂවල මාස 03ක සිට වර්ෂ 02 දක්වා කාලපරිච්ඡේදයක සිට පැවත එන එකතුව රු.1,323,291ක ණය ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | විශ්‍රාම වැටුප් නතර කර ඇත. | -එම- |

## 2.5 තැන්පත් ශේෂයන්

--------------------

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) තැන්පතු ගිණුම් 03කට අදාළව 2021 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ඉක්ම වූ රු.14,746,329ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 පරිදි කටයුතු කර නොතිබුණි. | 0-010-0-016-0-6000 කොන්ත්‍රාත් සඳහා වන ආරක්ෂිත තැන්පතු බැවින් තොරතුරු විමසා බලා ඉදිරියේ දී නිදහස් කිරීමට කටයුතු කරමි.<br>0-053-0-002-0-0-6000<br>අදාළ ආයතන මගින් ලිඛිත ඉල්ලීම් ඉදිරිපත් නොවූවහොත් මෙම වර්ෂය තුළ දී ආදායමට බැරකිරීමට කටයුතු කරමි.<br>0-027-0-013-0-0-6000<br>තොරතුරු විමසා ඇති අතර, තොරතුරු ලද පසු මෙම තැන්පතු තවදුරටත් රඳවා ගැනීම පිළිබඳ සලකා බලා ආදායමට බැර කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගැනීම. |

| | | |
|---|---|---|
| (ආ) අංක 01/2015 හා 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 04 (ඇ) ඡේදය ප්‍රකාරව එක් එක් තැන්පතු ගිණුමේ පවතින රැස් කරන ලද ආදායම එළඹෙන මාසයේ පළමු සතිය තුළ නිරවුල් කළ යුතු වුවද, 6000-0-0-014-0-004-0 දරන තැන්පතු ගිණුම මඟින් පළාත් සභා වෙනුවෙන් එකතු කරන ආදායම් අදාල චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ප්‍රේෂණය කර නොතිබුණි. | කෙරෝනා වසංගතය හේතුවෙන් පළාත් සභා ආදායම ප්‍රේෂණය කිරීම ප්‍රමාද වී ඇති අතර, ඉදිරියේ දී නියමිත පරිදි මාසයේ පළමු සතිය තුළ ආදායම ප්‍රේෂණය කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කිරීමට පියවර ගැනීම. |
| (ඇ) මු.රෙ 571 ප්‍රකාරව සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම ඉකුත් වූ සියලුම තැන්පතු පිළිබඳ ලැයිස්තු පිළියෙල කළ යුතු වුවත්, එසේ පිළියෙල කර නොතිබුණි. | කොරෝනා වසංගතය හේතුවෙන් වාර්තා යොමු කිරීම ප්‍රමාද වුවද, DMT/ACC/H/07 හා 2020.11.15 2020.02.17 දිනැති ලිපි මඟින් වාර්ෂික වාර්තා ඉදිරිපත් කර ඇත. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කිරීම. |
| (ඈ) තැන්පතු 03ක කේවල ශේෂ ලැයිස්තු අනුව 2021 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් කාර්යාලවල රු.12,058,836ක තැන්පතු ශේෂ පැවතියද, ඒවායේ විශ්ලේෂණයක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේ දී තවදුරටත් රඳවා නොගත යුතු තැන්පතුවක් වේ නම් ආදායමට බැර කිරීමට කටයුතු කරමි. | අවශ්‍යතාව අනුව විශ්ලේෂණ සහිතව වාර්තා සකස් කිරීම. |

**2.6 බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ 2021 දෙසැම්බර් 31 දිනට මාස 06 ඉක්මවූ රු.4,068,400ක් වටිනා චෙක්පත් 95ක් මු.රෙ. 96 (ඇ) ප්‍රකාරව ආදායමට බැර කිරීමට හෝ වෙනත් සුදුසු පියවරක් ගැනීමට කටයුතු කර නොතිබුණි. එම චෙක්පත් අතර වර්ෂය ඉක්මවන ලද රු.3,449,508ක් වටිනා චෙක්පත් 30ක් ද විය. | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත්වලින් රු.3,597,311කට අදාළ චෙක්පත් 30ක් නිරවුල් කර ඇති අතර ඉතිරි රු.471,089ක චෙක්පත් මු.රෙ.96 (ඇ) අනුව ආදායමට බැර කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි අනුකූලව කටයුතු කිරීම. |

## 2.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) මෝටර් වාහන පනත (203 වන අධිකාරය) | | | |
| (i) 30 (1)(ඊ)(iii) සහ අභ්‍යන්තර චක්‍රලේඛ 20/2020 | මෝටර් වාහනයක් ප්‍රථම වතාවට ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ දින සිට දින 03ක් ඇතුළත ආදායම් බලපත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ යුතු යුතු වුවත් ,වාහන 14ක් අතරින් වාහන 09ක් සඳහා 2009අප්‍රේල් සිට 2020ජුලි දක්වා පළමු ලියාපදිංචි දින සිට වසර 06සිට 19දක්වා දීර්ඝ කාලයකට එකවර ආදායම් බලපත්‍ර ලබා ගෙන තිබුණි. | පරිගණක දත්ත පරීක්ෂාවේ දී වාහනවලට අදාළ කවුළු අංක මුල් ලියාපදිංචි වර්ෂයට අදාළව ලබාගෙන ඇති බව නිරීක්ෂණය වේ. | පනතේ විධි විධාන පරිදි කටයුතු කිරීම. |
| (ii) 32 උප වගන්තිය | වාහන 14ක් අතරින් එක් වාහනයක් වෙනුවෙන් 2018 නොවැම්බර් 24 දින සිට 2018 නොවැම්බර් 25 දින දක්වා එක් දිනක් සඳහා පමණක් වලංගු වන පරිදි මුල්වරට බස්නාහිර පළාත් ආදායම් බලපත්‍ර අධිකාරියෙන් බලපත්‍රයක් නිකුත් කර තිබුණි. | ආදයම් බලපත්‍ර නිකුත් කිරීම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සෘජු අධීක්ෂණය යටතේ සිදුනොවන බව කාරුණිකව දැනුම් දෙමි. | -එම- |
| (iii) 30(1)(ඊ)(iii) උපවගන්තිය | පද්ධතිය තුළ පැවැති පැරණි හිස් වාහන අංක 05ක් සඳහා පසුව ඇතුලත් කළ නව වාහන අතරින් ලියාපදිංචි වර්ෂය වූ 1992 සිට 2019 වර්ෂය දක්වා වසර 27ක් වෙනුවෙන් එකවර ආදායම් බලපත්‍ර ලබාගෙන තිබුණි. | අඛණ්ඩව ආදායම් ලබා නොගත් රථ සඳහා ආදායම් බලපත්‍ර නිකුත් කිරීමට පෙර මෙම දෙපාර්තමේන්තුවෙන් විමසා කටයුතු කිරීමට උපදෙස් දී තිබේ. | -එම- |
| (iv) 30(1)(ඊ)(III) උපවගන්තිය | ඉහත සඳහන් පරිදි හිස් වාහන අංක 05ක් අතරින් එක් වාහනයක් වෙනුවෙන් පළමු ලියාපදිංචිය වූ 2015 දෙසැම්බර් 30 දිනට මාස 11කට පසු ආදායම් බලපත්‍ර ලබාගෙන තිබුණි. | ආදයම් බලපත්‍ර නිකුත් කිරීම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සෘජු අධීක්ෂණය යටතේ සිදුනොවන බව කාරුණිකව දැනුම් දෙමි. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| **(ආ)** | අංක 01/2015 හා 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 04 (ආ) ඡේදය | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ අනුව 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා සුබෝපභෝගී අංශයේ හිඟ බදු ආදායම රු.82,669,000 සිට රු.214,323,900 දක්වා රු.131,654,900කින් වැඩිවීමක් නිරීක්ෂණය වන අතර එම හිඟ ආදායම අයකර ගැනීමට හෝ අය වීමට ඇති හිඟ ආදායම තව තවත් එකතු වීම වැළැක්වීමට හෝ අදාළ ක්ෂණික පියවර ගෙන නොතිබීම. | බදු ගෙවීම පැහැර හැර ඇති හඳුනානොගත් සියලු වාහන හිමියන් සඳහා සිහි කැඳවීම් ලිපි යවා ඇත. රක්ෂණ ආයතන දැනුවත් කර ඇති අතර එමඟින් විශාල හිඟ බදු ආදායමක් අයකර ගැනීමට හැකි වී ඇති බව දන්වමි. | නීතිරීති හා රෙගුලාසි අනුව කටයුතු කිරීමට පියවර ගැනීම. |

**3 මෙහෙයුම් සමාලෝචනය**
---------------------------

**3.1 ප්‍රසම්පාදනයන්**
----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | --------------------------- | ------------ |
| (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.10 ඡේදය ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛණවල සඳහන් උපමාන සහ ක්‍රමවේදයට අනුව පළමුවෙන්ම ලංසු සූක්ෂම අන්දමින් ඇගයීමට භාජනය කළ යුතු අතර, එසේ අගයන ලද ලංසු සැසඳීමෙන් අවම මිලක් සහිත සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලංසුව කවරේද යන්න තීරණය කළ යුතු විය. එහෙත්, වාහන ලියාපදිංචි සහතික තැපැල් කරන කවුළුව සහිත ලියුම් කවර 300,000ක් මුද්‍රණය කර ගැනීම සඳහා වූ ප්‍රසම්පාදනයේ දී ලංසු ඉදිරිපත් කර තිබූ ආයතනවල ලංසු දෙපාර්තමේන්තු පිරිවිතරයන්ට අනුකූල ද යන්න පිළිඹිබු කෙරෙන ලංසු ඇගයීමේ වාර්තාවක් (ප්‍රසම්පාදන අත්පොත 7.11.1) තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිළියෙල කරන ලද බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | 2022 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතුවලදී මේ පිළිබඳ අවධානය යොමු කර කටයුතු කරන බවත්, නිළධාරීන් දැනුවත් කර ඇති බවත් සඳහන් කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) ප්‍රසම්පාන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) ඡේදය ප්‍රකාරව රු.500,000 ඉක්මවන භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවත්, රු.1,875,000 ඉක්ම වූ උක්ත ප්‍රසම්පාදනයට අදාළව දෙපාර්ශවය අතර විධිමත් ගිවිසුමක් ඇති කරගෙන නොතිබුණි. | භාණ්ඩ මිලදී ගැනීම වැනි ප්‍රසම්පාදන සඳහා කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළැඹී නොමැත. ඉදිරියේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතු වීම. |

**3.2** **රජයේ නිලධාරීන් ඇප තැබීම**

--------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ. 880 සඳහන් විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය මුදල්, ආදායම් භාරව සිටින නිලධාරීන් 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු බව දක්වා ඇති අතර, 1999 අප්‍රේල් 09 දිනැති 1/99 දරන රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව එසේ ඇප තැබිය යුතු නිලධාරීන් සහ අය කළ යුතු ඇප මුදල් ප්‍රමාණයන් පිළිබඳව උපදෙස් ලබා දී තිබුණි. එහෙත්, වේරහැර උප කාර්යාලයේ මුදල් කවුළු 04 හි සහ ප්‍රධාන සරප් අංශයේ මුදල් භාරගන්නා නිලධාරීන් පස් දෙනෙකු උක්ත චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඇප තබා නොතිබුණි. | වේරහැර කාර්යාලයේ මුදල් අයකිරීමට අදාළ රාජකාරී කටයුතුවල නිරත නිළධාරීන්ගෙන් ඇප මුදල් තැන්පත් කරවීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වීම. |

**3.3** **පාඩු හා හානි**

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019,2020,2021 හා 2022 යන වර්ෂයන් වලදී දෙපාර්තමේන්තුව සතු වාහන 8කට අවස්ථා 9 දී එකතුව රු. 1,177,965ක අලාභ සිදුවී තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(3) (4) හා 109 (1) (ආ) ප්‍රකාරව පිළියෙළ කල යුතු පොදු 283, පොදු 284 හා පොදු 285 වාර්තා වල පිටපත් මේ දක්වාම විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2019 හා 2020 වර්ෂයන්ට අදාළව මු.රෙ.104 මූලික පරීක්ෂණ සිදු කර නොමැති අතර ඉදිරියේ දී මු.රෙ.104(3)(4) හා 109 ප්‍රකාරව පිළියෙල කළ යුතු පොදු 283,204 හා 285 වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්තා පිළියෙල කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) 2002 නොවැම්බර් 13 දින සිට 2018 නොවැම්බර් 24 යන කාලසීමාවන්ට අදාලව වාහන තුනක් සඳහා වර්ෂ 30කට ආදායම් බලපත්‍ර ගාස්තු සහ දඩ වශයෙන් එකතුව රු.213,070ක් රජයට අහිමි වී ඇති බව නිරීක්ෂණය විය. | පිළිතුරු පසුව ඉදිරිපත් කරමි. | පනතේ විධිවිධාන පරිදි කටයුතු කිරීම |

**3.4 අනාර්ථික ගනුදෙනු**

---------------------

| විගණන නිරීක්ෂණය<br>---------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>--------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|
| මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වන වාහන පිළිබඳ තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලබාදීම අරමුණු කරගත් තොරතුරු හුවමාරු ක්‍රමවේදයට අදාළ පද්ධති සංවර්ධන ව්‍යාපෘතිය 2018 වර්ෂයෙන් පසු අක්‍රිය වී තිබුණු අතර ඒ වෙනුවෙන් මෙම දෙපාර්තමේන්තුව විසින් Informatics International (Ltd) ආයතනය වෙත 2018 දෙසැම්බර් 19 දින දක්වා ගෙවන ලද රු.2,420,000ක මුදල අනාර්ථික වියදමක් බව නිරීක්ෂණය විය. මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත පමණක් ලැබෙන අතර ඉන් කිසිදු ප්‍රතිලාභයක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත නොලැබෙන බව නිරීක්ෂණය විය. | 2018 වසරේ සිට මේ දක්වා **RAMIS** පද්ධතියට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තොරතුරු ලබා දීමට අදාළ කටයුතු ඉදිරියට සිදු වී නොමැති බවට ඔබ විසින් සිදුකළ නිරීක්ෂණය හා මම ද එකඟ වෙමි. | වැය කරන ලද මුදලට සරිලන උපයෝජනයක් ලැබෙන පරිදි රාජ්‍ය මුදල් භාවිතා කළ යුතු වීම. |

**3.5 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>---------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------- | නිර්දේශය<br>------------- |
|---|---|---|
| (අ) පද්ධතිය තුළ පැවැති පැරණි වාහනවල දත්ත වෙනස් කරමින් සුඛෝපභෝගී ජීප් රථ 11ක් ඇතුළු වාහන 14ක් සඳහා ගෙවිය යුතු නිශ්පාදන බදු, සුඛෝපභෝගී බදු සහ අනෙකුත් රජයේ අය කිරීම් යනාදී ලෙස රු.499,569,300ක ආදායමක් රජයට අහිමි වී තිබුණි. නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි විය. | | |

| | | |
|---|---|---|
| (i) මෝටර් වාහන පනතේ (203 වන අධිකාරිය) 08 වන වගන්තිය ප්‍රකාරව නියමිත ගාස්තුව ගෙවීම මත හැර කිසිම මෝටර් වාහනයක් ලියාපදිංචි නොකළ යුතු වුවද, පසුව පරිගණක පද්ධතියට සාවද්‍ය ලෙස නව ලියාපදිංචි දත්ත ඇතුළත් කර ලියාපදිංචි කළ වාහන 14 සම්බන්ධයෙන් ලියාපදිංචි ගාස්තු කිසිවක් අයකර නොතිබුණි. එක් වාහනයක් සඳහා ලියාපදිංචි ගාස්තුව රු.23,950ක් බැගින් රජයට අහිමි වූ මුළු ගාස්තු ආදායම රු.335,300ක් බව නිරීක්ෂණය විය. | මුදල් අය කිරීමකින් තොරව ඉදිරියට දත්ත ඇතුළත් කිරීම ගැටලු සහගත බව දන්වමි. | නිසි විමර්ශනයක් සිදුකර නීතිමය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ii) සාවද්‍ය ලෙස පරිගණක පද්ධතියට දත්ත ඇතුළත් කිරීම මගින් ලියාපදිංචි කළ වාහනවල වර්ෂ 07 ක් හෝ කිහිපයක් සඳහාම සුඛෝපභෝගී බදු ගෙවූ දිනය හඳුනාගත නොහැකි විය. පද්ධතියට නව දත්ත ඇතුළත් කිරීමේදී නිශ්චිත දිනයන් හඳුනාගත නොහැකි බැවින් 1900 ජනවාරි 01 ලෙස සටහන් කර තිබූ අතර මෙම වාහනවල නිෂ්පාදිත වර්ෂය 1996 සිට 2002 දක්වා තරම් පැරණි වර්ෂයන් විය. 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අදාළ දත්ත පරිගණකගත කිරීම් මගින් සාවද්‍ය ලෙස ලියාපදිංචි කර තිබූ මෙම ඩීසල් ජීප් රථවල එන්ජින් ධාරිතාව 2200cc ඉක්මවා තිබුණි. තවද, 2012 අංක 12 දරන මුදල් පනතේ 11 වන වගන්තිය මඟින් සංශෝධිත 1995 අංක 16 දරන මුදල් පනතේ පළමු වන උපලේඛනය පරිදි වර්ෂ 07ක් දක්වා, හිඟ හිටි සුඛෝපභෝගී බදු සහ ඊට සියයට 50ක දඩ මුදලක් ඇතුළුව රු.2,595,000ක් හා ඉදිරියේදී ලැබිය යුතු සුඛෝපභෝගී බදු රු.1,155,000ක් වශයෙන් රු.3,750,000ක සමස්ත බදු ආදායමක් රජයට අහිමි වී ඇති බව නිරීක්ෂණය විය. | මෙම වාහන 14 අතරින් වාහන 06ක් සඳහා බදු ගෙවා ඇති බවත් ඉතිරි වාහන සඳහා බදු අය කරගැනීමට කටයුතු කරන බවත් දන්වා සිටිමි. | -එම- |
| (iii) රේගු බදු නොගෙවා නීති විරෝධී ලෙස මෙරටට ආනයනය කළ හෝ මෙරට දී නීති විරෝධී ලෙස එකලස් කළ හෝ වාහන දත්ත දෙපාර්තමේන්තු පරිගණක පද්ධතියට සාවද්‍ය ලෙස ඇතුළත් කරමින් එම වාහන නීත්‍යානුකූල වාහන ලෙස මෙරට භාවිතය සඳහා මුදා හැර තිබීම නිසා වාහන 14ක් වෙනුවෙන් දළ වශයෙන් නිෂ්පාදන බදු රු.495,484,000ක් පමණ රජයට අහිමි වී තිබුණු බව නිරීක්ෂණය විය. | රේගු බදු හා නිෂ්පාදන බදු අයකරනු ලබන්නේ රේගු දෙපාර්තමේන්තුව විසින් අදාළ නිශ්කාශන බදු ගෙවීමෙන් පසු Data Link කිරීමට කටයුතු කරන අතර එම Data Link වී ඇති රථ පමණක් ලියාපදිංචිය සිදු කරයි. | -එම- |

| | | |
|---|---|---|
| (ආ) වාහන ලියාපදිංචි අංක අනුපිළිවෙලට නිකුත්කිරීම වෙනුවට ඇතැම් අංක හිස් ව තබමින් වාහන ලියාපදිංචි කර තිබුණු අතර, පසුව එම අංක වෙන්කළ හිස් අංක යටතේ පරිගණක පද්ධතියට සාවද්‍ය ලෙස දත්ත ඇතුළත් කර නව වාහන 05ක් ලියාපදිංචි කර තිබුණි. එමඟින් දළ වශයෙන් සුඛෝපභෝගී බදු,නිශ්පාදන බදු සහ අනෙකුත් රජයේ අය කිරීම් ලෙස රු.4,643,800ක් රජයට අහිමි වී ඇති බව නිරීක්ෂණය විය. | | |
| (i) මෝටර් වාහන පනතේ (203 වන අධිකාරිය) 08 වන වගන්තිය ප්‍රකාරව නියමිත ගාස්තුව ගෙවීම මත හැර කිසිම මෝටර් වාහනයක් ලියාපදිංචි නොකළ යුතු විය වුවද, නව ලියාපදිංචිය සඳහා ගාස්තු කිසිවක් අය නොකර පැරණි හිස් වාහන 05ක් සඳහා පසුව නව ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණු අතර එමඟින් රු.99,200ක පමණ ආදායමක් රජයට අහිමි වී තිබුණි. | වාහන 04ක් සඳහා මහජන බැංකුවේ රිසිට්පත් මඟින් මුදල් අය කරගෙන ඇත. | -එම- |
| (ii) මෙම වාහන 05 අතරින් එක් වාහනයක් වෙනුවෙන් 2018/2019 වර්ෂයේ සිට 2020/2021 වර්ෂය දක්වා ගෙවිය යුතු සුඛෝපභෝගී බදු රු.110,000ක් හා දඩ රු.55,000ක් ලෙස අහිමි වූ මුළු බදු වටිනාකම රු.165,000ක් විය. තවද, ඉදිරියේ දී අයවිය යුතු බදු රු.130,000ක් ද ඇතුළුව රු.295,000ක මුළු ආදායමක් රජයට අහිමි වී ඇති බව නිරීක්ෂණය විය. | මෙම වාහනය බදු අයවිය යුතු වාහනයක් ලෙස හඳුනාගෙන ඇති අතර වර්තමාන අයිතිකරු වෙත ලිපියක් මඟින් අදාළ බදු මුදල ගෙවීමට පැමිණෙන ලෙස ලිපියක් මඟින් දන්වා ඇත. | -එම- |
| (iii) කිසිදු රේගු ගාස්තුවක් නොගෙවා පසු දිනෙක පද්ධතියට සාවද්‍ය ලෙස දත්ත ඇතුළත් කිරීම මගින් ලියාපදිංචිය සිදුකර තිබීම නිසා රේගු නිෂ්කාශනයේදී රජයට අයවිය යුතු රු.4,249,600ක නිෂ්පාදන බදු ආදායමක් ද අහිමි වී තිබුණි | රේගු බදු හා නිශ්පාදන බදු අයකරනු ලබන්නේ රේගු දෙපාර්තමේන්තුව විසින් වන අතර අදාළ නිශ්කාශන බදු ගෙවීමෙන් පසු Data Link කිරීමට කටයුතු කරන අතර එම Data Link වී ඇති රථ පමණක් ලියාපදිංචිය සිදු කරයි. | -එම- |
| (ඇ) ද්විත්ව කාර්ය වාහන සඳහා වන ලියාපදිංචි අංක යටතේ විශේෂ කාර්යයන් සඳහා ආනයනය කළ වාහන ලියාපදිංචි කිරීම හේතුවෙන් 2018 හා 2019 වැනි වර්ෂවල දී වාහන 09ක් සඳහා පමණක් රු.27,472,988ක රේගු බදු මුදලක් රජයට අහිමි වී තිබුණු බව නිරීක්ෂණය විය. මෙලෙස සාවද්‍ය ලියාපදිංචි කිරීම් වැළැක්වීමට අභ්‍යන්තර පාලන ක්‍රමයක් හඳුන්වා දී නොතිබුණි. | ශ්‍රී ලංකා රේගුව මඟින් බදු මුදල් අය කර අප දෙපාර්තමේන්තු පරිගණක ජාලයට එම ගෙවීම් පිළිබඳ විස්තර සම්බන්ධ වීමෙන් පසුව පමණක් වාහන ලියාපදිංචිය සිදු කරයි.<br>මෙම වාහන 09 අතරින් PZA කාණ්ඩයට අයත් වන්නේ එක් වාහනයක් | නිසි විමර්ශනයක් සිදුකර අහිමි වී ගිය ආදායම් රජයට අය කර ගැනීමට කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| | | පමණක් වන බැවින් එම වාහනයේ ගොනුව ගෙන්වා අක්‍රමිකතාවයක් සිදු වී ඇත්දැයි කරුණු වාර්තා කිරීමට උපදෙස් ලබා දී ඇත. ඉදිරියේ දී මෙවන් අක්‍රමිකතාවයන් සිදු වීම වළක්වා ගැනීමට අභ්‍යන්තර චක්‍ර ලේඛයක් නිකුත් කර නිලධාරීන් දැනුවත් කර ඇත. |

**3.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව වෙත 2021 ගිණුම් වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 01කට පිළිතුරු 2022 මැයි 20 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | මේ වන විට එක් විගණන විමසුමක් හැර ඉතිරි සියලු විමසුම් සඳහා පිළිතුරු යොමු කර ඇත. | විගණන විමසුම් සඳහා අප්‍රමාදව පිළිතුරු ලබා දීම. |

**3.7 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පළාත් මෝටර් රථ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ආදායම් බලපත්‍රවලට අදාළ පරිගණක දත්ත ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (**ICTA**) සම්බන්ධීකරණය යටතේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත සම්ප්‍රේෂණය කිරීමේ **eRL 2.0** ව්‍යාපෘතිය 2021 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ දී දියත් කිරීමට බලාපොරොත්තු වුවද එම ව්‍යාපෘතිය ප්‍රමාදවීමෙන් වාහන පැවරීම වෙනුවෙන් ඉදිරිපත් කෙරෙන ආදායම් බලපත්‍රවල නිරවද්‍යතාවය දෙපාර්තමේන්තුව විසින් තහවුරු කර ගැනීම තවදුරටත් ප්‍රමාද වී තිබුණි. තවද, එය වාහන පැවරීම | පළාත් මෝටර් රථ දෙපාර්තමේන්තුවලින් ආදායම් බලපත්‍ර නිකුත් කිරීම සඳහා දැනට ක්‍රියාත්මක වන **eRL 1.0** වෙනුවට **eRL 2.0** සංවර්ධනය කෙරෙමින් පවතී. එම ව්‍යාපෘතිය මෙම වර්ෂයේ අගෝස්තු/සැප්තැම්බර් මාසයන් හි දී දියත් කිරීමට බලාපොරොත්තු වන අතර එමඟින් වාහන පැවරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ආදායම් බලපත්‍රවල නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුව වෙත ආදායම් බලපත්‍ර විස්තර ලබාගැනීමට නියමිත වේ. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාවට නැංවීම. |

| | | |
|---|---|---|
| සම්බන්ධයෙන් මනා අභ්‍යන්තර පාලනයක් පවත්වා ගෙන යාමට පවතින දුර්වලතාවයක් බව නිරීක්ෂණය විය. | | |
| (ආ) වාහන පැවරීම්වලට අදාලව නව අංක තහඩු නිකුත් කිරීමේදී භාරගන්නා ලද පැරණි අංක තහඩු විශාල ප්‍රමාණයක් ගම්පහ කාර්යාල පරිශ්‍රයේ අනාරක්ෂිත ලෙස සේවාලාභීන් බහුලව ගැවසෙන ස්ථානයකට ආසන්නව ගොඩගසා තිබුණි. | ඉවත් කරන ලද පැරණි අංක තහඩු හැකි ඉක්මනින් කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මිලදී ගැනීමට කටයුතු කරන බව දැනුම්දෙන ලදි. | විධිමත් අයුරින් අබලි ද්‍රව්‍ය අපහරණයට පියවර ගැනීම. |
| (ඇ) ලියාපදිංචි කර ඇති නමුත්, පරිගණක ගත නොකළ යතුරු පැදි නව ලියාපදිංචියට අදාළ ලිපිගොනු විශාල ප්‍රමාණයක් ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය තුළ යතුරු අගුළු ක්‍රියාත්මක නොවන කබඩ් තුළ බාහිර පාර්ශවයන්ට ළඟාවීමට හැකි ස්ථානයක අනාරක්ෂිත ලෙස අසුරා තිබූ අතර එම ලිපිගොනු දිරාපත්ව මීයන් හා කෘමි සතුන්ගෙන් හානි සිදු වී තිබුණි. | පිළිගනිමි. යතුරුපැදි නව ලියාපදිංචියට අදාළ ලිපිගොනු සුරක්ෂිත කිරීමට එකී කබඩ්වලට අගුලු සවි කිරීමට කටයුතු සකස් කර ඇත. | විධිමත් හා ආරක්ෂිත ලෙස ලිපි ලේඛන ගබඩා කිරීම. |
| **(ඈ)** ජර්මන් රජයේ පරිත්‍යාගයක් ලෙස වේරහැර වාහන පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථානයට 2004 වර්ෂයේදී ලද පරීක්ෂණ උපකරණ 06ක් 2022 මැයි 20 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | එම උපකරණවලින් යාන්ත්‍රිකව සිදු කළ හැකි ක්‍රියාවන් කිහිපයක් පමණක් සිදු කිරීමට හැකි ආකාරයට උපකරණ 02ක් පමණක් සකස් කර භාවිතා කරනු ලබයි. ඉහළ ප්‍රමිතියකින් යුතු තාක්ෂණික වාර්තාවක් සැපයීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට ප්‍රතිපාදන නොලැබුණු බැවින් මෙම උපකරණවල වර්තමාන තත්ත්වය හා නිර්දේශ ඉදිරිපත් කිරීමට ජ්‍යෙෂ්ඨ මෝටර් වාහන පරීක්ෂකවරයෙකුගේ සභාපතීත්වයෙන් යුතු කමිටුවක් පත් කර ඇත. | දෙපාර්තමේන්තුව සතු සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

| | | |
|---|---|---|
| (ඉ)වේරහැර උප කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත බහාලුම් 18ක ඇතුළත් වාහන ලියාපදිංචි මුල් ලිපිගොනු හා පැවරුම් ලිපිගොනු විධිමත් ක්‍රමවේදයකට ගබඩා කර නොතිබුණු අතර, ඇතැම් බහාලුම් තුළට වැසි වතුර කාන්දු වීම නිසා ලිපිගොනු හඳුනාගත නොහැකි ලෙස විනාශ වී තිබුණි. | කන්ටේනර් 08ක් දිරාපත් වී ලිපිගොනු විනාශ වී ඇති බැවින් එම හානි වූ ලිපිගොනු පරීක්ෂා කර වාර්තාවක් ලබාගැනීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ සභාපතීත්වෙන් යුත් කමිටුවක් පත් කොට දිරාපත් වී ඇති ලිපිගොනු හඳුනාගැනීමටත් බේරාගත හැකි ලේඛන ආරක්ෂිතව ගබඩා කිරීමටත් පියවර ගනිමි. | වාහන මුල් හා පැවරුම් ලියාපදංචි ලිපිගොනු විධිමත්ව හා ආරක්ෂිතව ගබඩා කිරීමට කටයුතු කිරීම. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 150ක් පිරවීමට හෝ විධිමත් සමාලෝචනයක් මඟින් කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු පිරවීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර ඇත. | නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලව අවශ්‍ය පුරප්පාඩු පිරවීම. |
| (ආ) හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයේ සහකාර කොමසාරිස්වරයෙකු විසින් වෙනස්කළ මුරපද සාවද්‍ය ලෙස පරිහරණය කර ලිඛිත පරීක්ෂණ 52ක් හා ප්‍රායෝගික පරීක්ෂණ 09ක් සමත් කර රියදුරු බලපත්‍ර නිකුත් කර තිබුණු අතර මෙලෙස එම නිලධාරියා විසින් සාවද්‍ය මුරපද භාවිතා කර රියදුරු බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් පවත්වන ලද මූලික විමර්ශනයේ ප්‍රගතිය මෙතෙක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | රියදුරු බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධ මූලික විමර්ශන කටයුතු ආරම්භ කර ඇති අතර, විමර්ශන කඩිනමින් අවසන් කර විගණනය වෙත ප්‍රගතිය වාර්තා කරමි | නිසි විමර්ශනයක් සිදු කර විනය ක්‍රියාමාර්ග ගැනීම හා මනා අභ්‍යන්තර පාලනයක් පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |